# zesta සමඟ දුර ගමනක්

සවස/පිටත/පාර

සවස් යාමය උදා වී ඇත.අහස කෙළවර රත් පැහැ ගැන්වී ඇත.බැස යන හිරු රැස් පොළවට පතිත වේ.ඉමක් නොපෙනෙන මහා මාර්ගයක ඈත සිට තද කොල පැහැති සංචාරයන් සඳහා භාවිතා කරන තරමික් නවීන පන්නයේ කාර් රථයක් තරමක් වේගයන් ඉදිරියට ඇදෙමින් ඇත.මෝටර් රථයේ ඉහල කූඩාරම් සෑදීම සදහා බාවිතා කරන බඩු අසුරා ඇති බව පෙනෙන්නට තිබේ.හොඳින් තාර දමා නිර්මාණය කර ඇති මාර්ගයේ දෙපසින්ම පෙනෙන්නේ කාන්තාර භූමියකි.අතරින් පතර කාන්තාරයට හුරු වූ තරමක් විශාල ගස් කීපයක්ද පෙනෙන්නට තිබේ.සවස් යාමය නිසා මඳ සුළඟක්ද හමා යන බව සෙලෙවෙන ගස් අතු වලින් පෙනේ. (හිරු රැස් පතිත වීම නිසා මෝටර් රථයේ නිශ්පාදන නාමය සහ මෝටර් රථ අංකය ආවරණය වී නොපෙනේ)

දර්ශන 02

සවස/පිටත/ගස අසළ

මාර්ගය අසල ඇති තරමක් විශාල ගස අසල ට පැමිනේන මෝටර් රථය නතර කරයි.මෝටර් රථයේ රියදුරු අසුනේ තරුණයෙකුද අනෙක් අසුනේ තරුණියක් ද සිටින ආකාරය පෙනේ.

චරිත ස්වභාවය

රියදුරු අසුනේ සිටින කඩවසම් පෙනුමැති තරුණ පුද්ගලයා කොණ්ඩය කොටට කපා ඇති අතර රැවුල සම්පූර්ණයෙන්ම කොටට කපා ඇත. සුදු පැහැති සැහැල්ලු ටීශටයක් හැද එයට උඩින් තද කොළ පැහැති අත් කොට කමිසයක් හැඳ සිටී කමිසයේ බොත්තම් දමා නැත.ක්‍රීම් පැහැයට හුරු කොට කලිසමක් හැඳ සිටින ඔහු සපත්තු පැළඳ සිටී.

අනෙක් පස සිටින ඇය සිහින් සිරුරක් හිමි පැහැපත් සුන්දර යුවතියකි.කොන්ඩය කඩාහල සිටින ඇය සුදු පැහැති අත් නැති ටීශටයක් හැද සිටින අතර එයට උඩින් ලා දුඹුරු පැහැයට හුරු අත් දිගු කමිසයක් හැද සිටී කමිසයේ බොත්තම් දමා නැත.කලවා තෙක් දිග් වූ ලා නිල් පැහැති ඩේනිම් කොට කලිසමකින් සැරසී සිටින ඇය.සුදු පැහැති සපත්තු යුගලක්ද පැළඳ සිටී.

දර්ශන 03

සවස/පිටත/ගස අසල

ගස අසල පසු පස පෙනෙන ලෙස මෝටර් රථය නවතා ඇත.අසල ඇති ලී වැට ළගට වී ඉහත සදහන් තරුණිය කැමරාවකින් චායාරූප ගනිමින් සිටින ආකාරය පසුපසින් පෙනේ.සවස් යාමයේ හමා එන මඳ සුළඟට ඇයගේ කොණ්ඩයේ කෙස් රොදක් එහා මෙහා යන ආකාරය පෙනේ.

දර්ශන 04

සවස/පිටත/ගස අසල

ඉහත සදහන් තරුණයා වාහනයේ පිටු පසට පැමිණ වාහනයේ ඩිකිය විවෘත කරයි.ඉදිරියෙන්

තරමක් ඈතින් ඇය ඡායාරූප ගනිමින් සිටින ආකාරය ද පෙනේ.

වාහනය අසල සංචාරයන් සඳහා භාවිතා කරන තාවකාලික කුඩා මේසයක්ද පුටු දෙකක් ද ඇත.

ඩිකිය විවෘත කරන ඔහුට එහි ඇති දෑ සමීපව නෙත ගැටේ.සංචාරකයෙකු සඳහා අවශ්‍ය අනෙකුත් බඩු අතර පසෙකින් තරමක් විශාල වේවැල් වලින් සාදන ලද මල්ලකි.

එහි zesta 390g තේ කොළ පැකට්ටුවක් මෙන්ම zesta green tea සහිත පෙට්ටියක් සහ zesta tea bags සහිත පෙට්ටියක් ද zesta සන්නාමය හා bopf නාමය පැහැදිලි ව පෙනෙන ලෙස අසුරා ඇත.එයට මඳක් ඈතින් උණුවතුර බෝතලයක්ද පසෙකින් කුඩා කේතලයක්ද පෙනෙන්නට තිබේ.ඩිකියේ අනෙක් කෙළවර ට වන්නට ගිටාරයක් ද පෙනෙන්නට තිබේ.

zesta තේ මල්ල දැක සතුටු වන ඔහු, ඔහුට ඉදිරියෙන් ඈතින් පෙනෙනා ඡායාරූප ගනිමින් සිටින ඇය දෙස බලා සිනා සෙමින් zesta tea bag සහිත පෙට්ටිය අතට ගනී.

දර්ශන 05

සවස/පිටත/ගස අසල

ඔහු මේසය අසල සිටී.මේසය මත තබා ඇති සුදු පැහැති පෝසිලෙන් කොප්පයකට උණු වතුර කුඩා කේතලයෙන් වත් කරන ආකාරය පෙනේ කෝප්පය තුළ ඇති zesta තේ බෑගය පෙගී උණු වතුර සමඟ කහට මුසුවන ආකාරය පෙනේ.zesta තේ බෑගයේ කෙළවර නූලෙහි ඇති zesta නාමය පැහැදිලි ව පෙනේ.

මේසය මත zesta tea bags සහිත පෙට්ටියද පැහැදිලි ව පෙනෙන්නට තිබේ.අනෙක් තේ කොප්පය ද zesta තේ බෑගයක් සහිත තිබෙන ආකාරය පෙනේ.
තේ කෝප්පය අතට ගෙන තරමක් උඩට උස්සා ඇය සිටින දෙස බලමින් සිනා මුසු මුහුණෙන් සිටින ඔහු තේ කෝප්පයට හැන්දෙන් තට්ටුවක් දමයි. (zesta ශබ්ද ප්‍රයෝගය භාවිතා වේ).

ටිං ටිං ශබ්දය ඇසීමත් සමඟ සිනාමුසු මුහුණෙන් කැමරාව අතට ගෙන ඇය හැරී බලයි.

දර්ශන 06

සවස/පිටත/ගස අසල

ඇය ඔහු අසලට පැමිණ සිටී.ආදරණීය ලෙස ඔහුගේ අතෙහි ඉහළ ස්පර්ශ කරන ඇය.zesta තේ කෝප්පය දෑතින්ම ගෙන දෑස් පියා ගනිමින් තේ උගුරක් පානය කරයි.ඉන් ප්‍රබෝධමත් වන ඇයගේ මුවින්

"ම්...ම්...zesta" යනුවෙන් කියවේ.

ඒත් සමඟම පුටුව මත තබා ඇති ගිටාරයක අතට ගන්න ඔහු එයින් මිහිරි තනුවක් වයයි.
තේ කෝප්පය අතැතිව ඇයත් ගිටාරයයේ තනුවට ගීතයක් ගයන අයුරු පෙනේ. ඒත් සමඟම ඇය තම ජංගම දුරකථනය අතට ගෙන ඔහුට ළංවී හිසට හිස තබා ගනිමින් දෙදෙනා ම සිනා සෙමින් තේ කෝප්පය ද පෙනෙන ලෙස අත තබා ගනිමින් selfe ඡායාරූපක් ද ගන්නා ආකාරය පෙනේ. ඒත් සමඟම මේසය මත ඇති zesta tea bags සහිත පෙට්ටිය හා ඔහුගේ තේ කෝප්පය ද දුම් දමමින් ඇති ආකාරය සමීපව පෙනේ.

පසුබිමෙන්

"zesta එක්ක ආදරයෙන් දුර ගමනක් යන්න"